නව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ

2018 වර්ෂයේ දී මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පහත පොලිස් ස්ථානයන්හි නව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ වල ඉදිකිරීම් සිදු කරන ලදි. එක් පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ගොඩනැගිල්ලක් සඳහා රු.මි.5ක උපරිමයට යටත්ව ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර 2019 වර්ෂයේ දී එය මිලි. 6 දක්වා වැඩිකරන ලදි. ඊට අමතරව රු.මිලි.0.5 ක් නව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ උපකරණ සඳහා ද නාම පුවරුව සඳහා ද රු.20000.00 ක ප්‍රතිපාදන ද ලබා දේ.

| දිස්ත්‍රික්කය | පොලිස් ස්ථානය | ඉදිකිරීම් අවසන් කරන ලද වර්ෂය |
|---|---|---|
| පුත්තලම | හලාවත | 2018 |
| කුරුණෑගල | කුලියාපිටිය(බටහිර) | 2019 |
| කුරුණෑගල | පඬුවස්නුවර (බටහිර) - හෙට්ටිපොල | 2019 |
| මාතලේ | මාතලේ | 2019 |
| කළුතර | කළුතර | 2019 |
| මහනුවර | හසලක | 2020 |
| හම්බන්තොට | සූරියවැව | 2020 |
| කෑගල්ල | රඹුක්කන | 2019 |
| කෑගල්ල | යටියන්තොට | 2020 |

2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද ඉදිකිරීම් 2019 වර්ෂය තුල දී අවසන් කර ඇති නමුත් උපකරණ ලබා දීම සහ නාමපුවරු සකස් කිරීම 2020 වර්ෂයේ දී ද සිදු කෙරේ.

මේ වන විට 2014 වර්ෂයේ සිට ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ නව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ 43 ක් ජනතා සේවය සඳහා පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත භාර දී ඇත.